නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ යමක් මෙනෙහි කරමින්: "එය දැනුම පහව යන කාලයේ සිදු වේ

සියාද් ඉබ්නු ලබීද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ යමක් මෙනෙහි කරමින්: "එය දැනුම පහව යන කාලයේ සිදු වේ යැයි පැවසූහ. මම: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! දැනුම පහව යන්නේ කෙසේ ද? අපි අල් කුර්ආනය කියවමු. එමෙන්ම අපේ දරුවන්ටත් කියවන්නට උගන්වන්නෙමු. එමෙන්ම අපේ දරුවන් ද ඔවුන්ගේ දරුවන්ටත් එලෙස මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය තෙක්ම උගන්වමින්
සිටිති' යැයි පැවසුවෙමි. එතුමාණෝ: "සියාද්, ඔබේ මව නැසී යනු ඇත. මදීනාවේ සිටින බුද්ධිමත්ම තැනැත්තා ඔබ යැයි මම සිතා සිටියෙමි. මේ යුදෙව්වන් හා කිතුනුවන් තව්රාතය
හා ඉන්ජීලය කියවන නමුත් ඒ දෙකෙහි ඇති දෑ අනුව කටයුතු නොකරනවා නොවේ ද?"යැයි විමසා සිටියහ.
[صحيح لغيره] [رواه ابن ماجه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම සහගාමීන් අතර වාඩි වී සිටිය දී "එය දැනුම අත්පත් කර ගනු ලබන, දැනුම මිනිසුන්ගෙන් උදුරා ගනු ලබන කාලයයි" යනු පවසා සිටියහ. සියාද් ඉබ්නු ලුබෙයිද් අල්-අන්සාරී (රළියල්ලාහු අන්හු) තුමා පුදුමයට පත්ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගෙන් මෙසේ විමසා සිටියේය. ""දැනුම අත්පත් කර ගනු ලබනුයේ කෙසේ ද එය අපෙන් පහව යනුයේ කෙසේ ද? සැබැවින්ම අපි අල් කුර්ආනය කියවා ඇත්තෙමු. එය අපි කටපාඩම් කර ඇත්තෙමු. අල්ලාහ් මත දිවුරා පවසමි අපි එය කියවා අපගේ කාන්තාවන්ට දරුවන්ට මෙන්ම ඔවුන් ද ඔවුන්ගේ දරුවන්ට දරුවන්ගේ දරුවන්ට උගන්වා දෙන්නෙමු" යැයි පැවසීය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පුදුමයට පත්ව "අහෝ සියාද්! ඔබට කුමක් වීද! සැබැවින්ම ඔබ මදීනා වාසී විද්වතුන් අතර කෙනෙකු බව මම සිතා සිටියෙමි" යැයි පැවසූහ. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: සැබැවින්ම දැනුම අහිමි වී යන්නේ කුර්ආනය අහිමි වී යාමෙන් නොව, දැනුම අහිමි වී යන්නේ ඒ අනුව ක්රියා නොකිරීම හේතුවෙන් බව පැහැදිලි කළහ. යුදෙව්වන් හා කිතුනුවන් අතර තව්රාතය හා ඉන්ජීලය විය. නමුත් ඒ සමගම ඒවා ඔවුනට ප්රයෝජනවත් වූයේ නැත. ඒ දෙකෙහි අපේක්ෂිත කරුණින් ඔවුන් ඵල නෙලා ගත්තේ ද නැත. එය ඔවුන් දැනගත් දේ අනුව ක්රියා කිරීමය.

http://www.sunnah.global/hadeeth/si/show/65045